# 7 ශ්‍රේණිය සිංහල -2022

## 03 ඒකකය

# අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

07 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 04ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 03. අක්ෂර මාලාව සහ අක්ෂර වින්‍යාසය



භාෂාවක් සෑදී ඇත්තේ ශබ්දවලින් වන අතර එම ශබ්ද ඇසට පෙනෙන පරිදි ලියා දැක්වීමට අක්ෂර - එනම් අකුරු - යොදා ගනී. මෙහි අක්ෂර වින්‍යාස රීති ඇතුළත් කොටස සම්පාදනය කර ඇත්තේ මහාචාර්ය සඳගෝමි කෝපරහේවාගේ සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය කෘතිය ඇසුරෙනි.

## සිදත් සඟරා හෝඩිය (මුළු අක්ෂර ගණන 30)

- අදින් වසර 800කට පමණ පෙර සිදත් සඟරාව ලියවී ඇත.
- එය අප සතුව පවතින පැරණි ම ව්‍යාකරණ ග්‍රන්ථයයි.
- එහි ඇතුළත් සිංහල හෝඩිය පද්‍ය රචනය සඳහා භාවිත වූ අක්ෂරවලින් පමණක් සමන්විත බව උගතුන්ගේ මතයයි.
- එහෙත් ඊට ආසන්න කාලයේ ගද්‍ය ග්‍රන්ථ ලිවීමේ දී මෙම අක්ෂර මාලාවේ ඇතුළත් නො වූ වෙනත් අක්ෂර ද භාවිත කර ඇත.

| ස්වර 10 | අ | ආ | ඉ | ඊ | උ | ඌ |
|---|---|---|---|---|---|---|
| | එ | ඒ | ඔ | ඕ | | |

| ව්‍යඤ්ජන 20 | | | | |
|---|---|---|---|---|
| | ක | ග | ජ | |
| | ට | ඩ | ණ | |
| | ත | ද | න | |
| | ප | බ | ම | |
| | ය | ර | ල | ව |
| | ස | හ | ළ | |
| | අං | | | |

- පාලි හා සංස්කෘත යන භාෂාවල හමුවන මහාප්‍රාණ අකුරු, තාලුජ 'ශ', මූර්ධජ 'ෂ' මෙන්ම සඤ්ඤක අක්ෂර ද සිදත් සඟරා හෝඩියේ ඇතුළත් නොවේ.

## වර්තමානයේ භාවිත සිංහල අක්ෂර මාලාව (මුළු අක්ෂර ගණන 60)

- අද භාවිත කෙරෙන සිංහල හෝඩියට අකුරු හැටක් ඇතුළත් වී ඇත්තේ කලින් කල භාෂාවේ සිදු වූ වෙනස්කම්වල ප්‍රතිඵල වශයෙනි.

**ස්වර 18**

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |

**ව්‍යඤ්ජන 42**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ)ං | (අ)ඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

- පාලි, සංස්කෘත භාෂාවල බලපෑම නිසා අද භාවිත කෙරෙන සිංහල හෝඩියට එක් වුණු අක්ෂර කිහිපයකි.
  - ✓ ස්වර - ඍ, ඎ, ඏ, ඐ, ඓ, ඖ
  - ✓ මහාප්‍රාණ අක්ෂර 10
  - ✓ ඞ, ච, ඤ අක්ෂර, මූර්ධජ ෂ, තාලුජ ශ
  - ✓ (අ)ඃ යන ව්‍යඤ්ජනය
- ෆ අක්ෂරය F/Ph ඉංගිරිසි හා ඕලන්ද වැනි භාෂාවල බලපෑම නිසා අද භාවිත කෙරෙන සිංහල හෝඩියට එක් වුණු අක්ෂරයකි.
- සඤ්ඤක අක්ෂර පහ සිංහල භාෂාවට ම අනන්‍ය වූ අක්ෂර විශේෂයකි.

# අල්පප්‍රාණ අක්ෂර

- උච්චාරණය කිරීමේ දී අඩු හඬකින් ශබ්ද වන අක්ෂර, අල්පප්‍රාණ අක්ෂර ලෙස හැඳින්වේ.
- වර්තමානයේ භාවිත කෙරෙන සිංහල හෝඩියේ අල්පප්‍රාණ අක්ෂර 10ක් ඇත.

| | | | | |
|---|---|---|---|---|
| ක | ච | ට | ත | ප |
| ග | ජ | ඩ | ද | බ |

| | | | | | |
|---|---|---|---|---|---|
| ක | - | කසය | ග | - | ගස |
| ච | - | චතුර | ජ | - | ජම්බු |
| ට | - | ටකය | ඩ | - | ඩක්කුව |
| ත | - | තම්පලා | ද | - | දරුවා |
| ප | - | පල්ලිය | බ | - | බල්ලා |

# මහාප්‍රාණ අක්ෂර

- උච්චාරණයේ දී ශ්වසන වායුව වැඩි ප්‍රමාණයක් පිට කරමින් ශබ්ද කරන අක්ෂර, මහාප්‍රාණ අක්ෂර ලෙස හැඳින්වේ.
- වර්තමානයේ භාවිත කෙරෙන සිංහල හෝඩියේ මහාප්‍රාණ අක්ෂර 10ක් ඇත.

| | | | | |
|---|---|---|---|---|
| ඛ | ඣ | ඨ | ථ | ඵ |
| ඝ | ඡ | ඪ | ධ | භ |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඛ | - | ඛණ්ඩ | ඝ | - | ඝණ්ටාව |
| ඣ | - | ඣන්න | ඡ | - | ඡංකර |
| ඨ | - | ඨපනීය | ඪ | - | පෞඪ |
| ථ | - | ථූපය | ධ | - | ධර්මය |
| ඵ | - | ඵලදාව | භ | - | භයානක |

# සඤ්ඤක අක්ෂර

- වර්තමානයේ භාවිත කෙරෙන සිංහල හෝඩියේ සඤ්ඤක අක්ෂර 5ක් ඇත.
- සිංහල භාෂාවට ම අනන්‍ය වූ අක්ෂර විශේෂයකි.
- පදයක මුල නො යෙදේ.
- හල් වී යෙදෙන්නේ ද නැත.
- සඤ්ඤක ඦ යන්න වර්තමාන ලේඛන ව්‍යවහාරයේ දක්නට නැත.

| | | | | |
|---|---|---|---|---|
| ඟ | ඦ | ඬ | ඳ | ඹ |

නල මුදු සුවඳ පිරි කුඹු මියුරු අඹ ගෙඩි
පුල හෙළ කුසුම ලිය පිය තෙපල රන් කෙඬි
සල සුදු සෙමෙර සේසත් ගිජිඳුනොද වැඩි
බල සුබ නිමිති පෙරමඟ නැකතටත් වැඩි

ඟ - අඟන
ඦ - ඉඦුඃ
ඬ - කෙඬි
ඳ - සුවඳ
ඹ - අඹ

**අවබෝධය**

1. පැරණි හෝඩියේ නොමැති වුවත් වර්තමානයේ භාවිත සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් අක්ෂර වර්ග දෙකක් නම් කරන්න.
2. සිදත් සඟරා හෝඩියේ ඇති ස්වර අකුරු ලියා දක්වන්න.
3. සඤ්ඤක අකුරු ලියා දක්වන්න.
4. සිංහල අක්ෂර මාලාවේ මහාප්‍රාණ අක්ෂර කීය ද? ඒ මොනවා ද?
5. සිදත් සඟරා හෝඩියේ ඇතුළත් නො වූ නමුත් එය ලියැවුණු යුගයේ පොත පතෙහි යෙදුණු ස්වරයක් පාඩම ඇසුරෙන් නම් කරන්න.

- **අවබෝධය**

1.
   - ✓ සඤ්ඤක අක්ෂර.
   - ✓ මහාප්‍රාණ අක්ෂර.

2. අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඒ, ඔ, ඕ.

3. ඟ, ඦ, ඬ, ඳ, ඹ.

4. 10යි. ඛ, ඝ, ඡ, ඨ, ඪ, ඵ, ඣ, ඪ, ධ, භ.

5. ඇ, ඈ, ඍ, ඎ, ඏ, ඐ, ඓ, ඖ

# අක්ෂර වින්‍යාස රීති

- ලේඛනයේ එන කිසියම් පදයකට අයත් අක්ෂර එකිනෙකට ගළපා ලියනු ලබන අනුපිළිවෙළ අක්ෂර වින්‍යාසය යනුවෙන් හැඳින්වේ.
- සිංහල ලේඛකයන් අතර පිළිගැනීමට ලක් වී ඇති අක්ෂර වින්‍යාස රීති හෙවත් රටා කිහිපයක් පහත දැක්වේ.

I. **මූර්ධජ "ණ" අක්ෂරය භාවිතය**

1. ආරම්භයෙහි "ණ" යෙදෙන්නේ "ණ"ය යන වචනයේ පමණි.
   උදා - ණය, ණයකාරයා, ණයගැති, ණයමුදල්, ණයකරු

2. නාම පදවල හා විශේෂණ පදවල "ර" යන්නට පසුව "ණ" යෙදේ.
   උදා - අධිකරණ, අසාධාරණ, උපකරණ, පුරාණ, පරිණාමය, උදාහරණ

3. හල් "ර" යන්නට පසුව "ණ" යෙදේ.
   උදා - කර්ණ, අසම්පූර්ණ, වර්ණ, සංකීර්ණ, සම්පූර්ණ

4. රකාරාංශය සහිත අක්ෂරයකට පසුව ද "ණ" යෙදේ.
   උදා - ආමන්ත්‍රණ, ප්‍රණාම, මුද්‍රණ, ශ්‍රේණිය, මිශ්‍රණ

5. ගැටය සහිත ඇලපිල්ලට පසුව ද "ණ" යෙදේ.
   උදා - ඍණ, තෘණ

6. “ෂ” අක්ෂරයකට පසුව ද “ණ” යෙදේ.
උදා - තෘෂ්ණාව, පාෂාණ, දූෂණ, භික්ෂුණී, පරීක්ෂණය

7. ගෞරවාර්ථය හැඟවීමට භාවිත කෙරෙන පදවල “ණ” යෙදේ.
උදා - පියාණෝ, පියාණන්, පුතණුවෝ, දියණියෝ, පුතණ්ඩ, මෑණියෝ

8. පහත ආකාරයේ අතීත කාල ක්‍රියා පදවල “ණ” යෙදේ.

| | | | |
|---|---|---|---|
| උදා - ඇමිණිණ, | ඇමිණිණි, | ඇමුණුණ, | ඇමුණුණු |
| ගැණිණ, | ගැණිණි, | ගැණුණ, | ගැණුණු |
| පැමිණිණ, | පැමිණිණි, | පැමුණුණ, | පැමිණුණු |
| විකිණිණ, | විකිණිණි, | විකිණුණ, | විකිණුණ |
| ලැබිණ, | ලැබිණි, | වැටිණ, | වැටිණි |
| ලැබුණ, | ලැබුණු, | ඇසුණ, | ඇසුණු |
| ලැබුණා ය, | ලැබුණාහ, | ලැබුණෙමි, | ලැබුණෙමු |
| ලැබුණෙමු, | ලැබුණේ ය | ලැබුණොත්, | ලැබුණෝ ය |

9. “ට,ඨ,ඩ,ඪ,ණ යන මූර්ධජ අක්ෂරවලට මුලින් “ණ” යෙදේ.
උදා - ඝණ්ටාර, කණ්ටක, අභිගුණ්ඨික, කණ්ඨජ, අඛණ්ඩ, ආණ්ඩු තම්බපණ්ණි, වණ්ණනා, කණ්ඨජ

## II. දන්තජ "න" අක්ෂරය භාවිතය

1. පදාවසානයේ හල් වේ නම් “න” යෙදේ.
උදා - අත්සන් (අත්සන), ඉක්මන් (ඉක්මන), කන් (කන), දරුවන්

2. “ර” යන්නට පසුව පදාවසානයේ “න” යෙදේ.
උදා - පුරන්, මිනිරන්, තොරන්, රන්, බමරුන්, මසුරන්, ඇසුරෙන්

3. “ත,ථ,ද,ධ,න” යන අකුරකට මුලින් හල් වී “න” යෙදේ.
උදා -ප්‍රාන්ත,චිරන්තන, ග්‍රන්ථ, මකරන්ද,චන්දන, අන්ධ, සුගන්ධ, ස්කන්ධ

4. ක්‍රියා පදවල “ර” අකුරකට පසුව “න” යෙදේ.
උදා - කරනවා, කරන්න, කරනු, කරන, හදාරනු, හදාරනවා, මරන්න

5. තාලුජ “ශ” අකුරකට පසුව ද “න” යෙදේ.
උදා - දේශන, ප්‍රශ්න, දර්ශන, විමර්ශන, ගවේශන

6. දන්තජ “ස” අක්ෂරයකට පසුව ද “න” යෙදේ.
උදා - අස්සන, වස්සාන, අස්න, ලස්සන, අවලස්සන

7. “න්න” යනුවෙන් අවසන් වන ඒක වචන නාම පදවල “න” යෙදේ.
   උදා - ඉන්න, ගින්න, ඔටුන්න, දුන්න, ඇතින්න, යකින්න, හැපින්න

8. ඉංග්‍රීසි, අරාබි වැනි භාෂාවලින් පැමිණි පදවල “ර” අක්ෂරයකට පසුව ද “න” යෙදේ.
   උදා - අර්නස්ට් (Earnest), වර්නන් (Vernan), කුරානය (Quaran), ඉරානය (Iran), නියුරෝනය (Neuron), ලර්නර්ස් (Learners), ඇන්ටෙනාව (antenna), කැලැන්ඩරය (calander), ටෙන්ඩරය (tender), වැලන්ටයින් (valentine)

9. දෙමළ බසින් ආ පදවල “ණ” හෝ “න” යෙදේ.
   උදා - කණ්ණාඩි/කන්නාඩි, වණ්ණම/වන්නම

## III. මූර්ධජ "ළ" අක්ෂරය භාවිතය

1. ළපටි, බාල, නො මේරූ අර්ථය දෙන පද “ළ” යන්නෙන් ආරම්භ වේ.
   උදා - ළදැරිය, ළපලු, ළහිරු, ළාබාල, ළද, ළමා, ළාමක, ළමයා

2. හෘදය, හදවත, සිත, පපුව අර්ථය දෙන පද “ළ” යන්නෙන් ආරම්භ වේ.
   උදා - ළබැඳි, ළමැද, ළය, ළැම, ළෙන්ගතු, ළෙහි

3. සමීප, ආසන්න, නුදුරූ යන අර්ථය දෙන පද “ළ” යන්නෙන් ආරම්භ වේ.
   උදා - ඊළඟ, ළං (වෙනවා), ළඟ, ළඟින්, තුළ

4. “ළ” යන්නෙන් ආරම්භ වන වෙනත් වචන කිහිපයකි.
   උදා - ළඳ (කාන්තාව), ළැහැබ, ළිඳ, ළැව්, ළෙන්, ළියදි, ළිහිණි

5. “පිළි” යන්නෙන් ආරම්භ වන පද වල “ළ” යෙදේ.
   උදා - පිළිගන්නවා, පිළිතුරු, පිළිබඳ, පිළිවෙළ, පිළිසරණ, පිළිමය

6. “පොළ” යන්න යෙදෙන විට “ළ ” යෙදේ.
   උදා - අඹන්පොළ, වෙළඳපොළ, ගම්පොළ, වැඩපොළ, දුම්රිය පොළ, ගුවන් තොටුපොළ, සතිපොළ

## IV. දන්තජ "ල" අක්ෂරය භාවිතය

1. පද අවසානයෙහි හල් වේ නම් “ල” යෙදේ.
   උදා - කකුල (කකුල්), තොල (තොල්), ගල්, මල්, මුල්

2. "ල්ල" යෙදෙන පදවල "ල" යෙදේ.
උදා - ඇඟිල්ල, සියල්ල, මහල්ලා, මල්ල, බෙල්ල, වැල්ල, බල්ලා

3. දෙමළ බසින් ආ පදවල "ළ" හෝ "ල" යෙදේ..
උදා - කළපුව/කලපුව (දෙ. කළප්පු)
මාළිගාව/මාලිගාව (දෙ. මාළිකෙ)

## V. තාලුජ "ශ" අක්ෂරය භාවිතය

1. "ව" යන්නට මුලින් "ශ" යෙදේ.
උදා - අශ්වයා, ආශ්වාස, විශ්වය, විශ්වාස, අවශ්‍යතා, වශයෙන්

2. "ච" යන්නට මුලින් "ශ" යෙදේ.
උදා - ආශ්චර්යය, නිශ්චල, පශ්චාත්, පශ්චිම, ශුචිය, ශෝචනීය

3. "ශ" අකුරු දෙකක් එකට යෙදේ.
උදා - නිශ්ශබ්ද, දුශ්ශීල, නිශ්ශංකමල්ල

4. "ශ" අකුරෙන් ඇරඹෙන වචන රාශියකි.
උදා - ශබ්ද, ශස්‍ය, ශාස්ත්‍ර, ශතක, ශල්‍ය, ශිඛර, ශරීර, ශක්‍ර, ශුද්ධ,
ශිලා, ශිෂ්‍ය, ශිල්පය, ශීත

## VI. මූර්ධජ "ෂ" අක්ෂරය භාවිතය

1. "ට" අක්ෂරයට පෙර "ෂ" යෙදේ.
උදා - විශිෂ්ට, දුෂ්ට, අනිෂ්ට

2. "ඨ" අක්ෂරයට පෙර "ෂ" යෙදේ.
උදා - කනිෂ්ඨ, ජ්‍යේෂ්ඨ, ශ්‍රේෂ්ඨ, ධර්මිෂ්ඨ

3. "ක" අක්ෂරයට පෙර "ෂ" යෙදේ.
උදා - ශුෂ්ක, දුෂ්කර, අපේක්ෂක, නිෂ්ක්‍රීය

4. "ප" අක්ෂරයට පෙර "ෂ" යෙදේ.
උදා - පුෂ්ප, නිෂ්ඵල, වාෂ්ප, නිෂ්පාදන

5. ශ, ෂ අකුරු එක ළඟ යෙදෙන විට "ශ" යන්න මුලින් යෙදේ.
උදා - විශේෂ, ශිෂ්ටාචාරය, ශිෂ්‍යයා, අවශේෂ

VII. **දන්තජ "ස" අක්ෂරය භාවිතය**

6. "ත" අක්ෂරයට පෙර "ස" යෙදේ.
උදා - පුස්තකාල, සමස්ත, ප්‍රස්තාර, ප්‍රස්තාව, වස්තු, වාස්තු, විස්තර

7. වෙනත් අවස්ථා.
උදා - ආභාසය, ආස්වාදය, විස්මය, කොට්ඨාස

- **පාඩම් සැලසුම සඳහා උපදෙස්:**

✓ නිවැරදි අකුරු නිවැරදි පිළිවෙළට යෙදීම අක්ෂර වින්‍යාසය යි.
✓ නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිතයෙන්
  ➢ භාෂාවේ අනන්‍යතාව සුරැකෙයි.
  ➢ වැරදි අර්ථ මතු වීම වැළකෙයි.
  ➢ ලේඛනයේ ව්‍යක්තභාවය සුරැකෙයි.
✓ විශේෂයෙන් න, ණ, ල, ළ, ශ, ෂ, ස අකුරු වචනවල යෙදීමේ දී සැලකිලිමත් විය යුතු වේ.
✓ සිංහල අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර 5කි.
  ➢ ඟ, ඦ, ඬ, ඳ, ඹ
✓ අදාළ ස්ථානවල සඤ්ඤක අක්ෂර නොයෙදීමෙන් වචනවල අර්ථ වෙනස් වේ. උදා :
  ➢ අගල - අඟල, අඩ - අඬ, ඇද - ඇඳ, අබ - අඹ
✓ සිංහල අක්ෂර මාලාවේ අල්ප ප්‍රාණ අක්ෂර 10ක් ඇත. ඊට අනුරූප මහා ප්‍රාණ අක්ෂර10ක් ද ඇත.
✓ අල්ප ප්‍රාණ, මහා ප්‍රාණ අක්ෂර නිවැරදි ව භාවිත කිරීම ලේඛනයේ ව්‍යක්තභාවය සඳහා අවශ්‍ය වේ.
  ➢ ඡන්දය - චන්දය

**ලිඛිත අභ්‍යාස**

1. පහත දැක්වෙන කවියෙහි යෙදී ඇති සඤ්ඤක අකුරු සහිත පද උපුටා දක්වන්න.

සල් සපු කීණ දොඹ රැ රඟ නා මිදෙලී
පුල් එරහැඳි හෝපලු මී අඹ පළොලී
පොල් පුවකුඟු රඹ මල බුලත සලිමලී
නිල් ගත සා සෙවණැලු දෙතෙර මනකලී

- **ලිඛිත අභ්‍යාස**

1. දොඹ, රඟ, එරභැඳි, අඹ, පුවකුඟු, රඹ

2. **පහත සඳහන් පාඨය කියවා එහි යෙදී ඇති මහාප්‍රාණ අක්ෂර සහිත වචන උපුටා දක්වන්න.**

"ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන මේ ශ්‍රී ලංකාද්වීපයෙහි සතුරු ගනඳුරු බිඳ හැර ධවල ඡත්‍ර නැංවූ ශ්‍රේෂ්ඨ නරපතියකු වූ වට්ටගාමිණී අභය මහ රජුගේ රාජ්‍ය සමයේ මාතලේ අලු ලෙනේ දී මහා සංඝ රත්නය විසින් ත්‍රිපිටක ධර්ම සංගායනාවක් පවත්වා අඛණ්ඩව ආරක්ෂා කර ගැනීම සඳහා ග්‍රන්ථාරූඪ කර තැබීම ශාසන ඉතිහාසයේ වඩාත් ප්‍රතිඵල දායක වූ සංසිද්ධියකි."

3. **පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට සුදුසු වචනය ඉදිරියේ ඇති වරහනින් තෝරා වාක්‍යය සම්පූර්ණ කරන්න.**

   i. සම්ප්‍රදායානුකූලව පොල් තෙල් ..................... දල්වා උත්සවය ආරම්භ කෙරිණි. (පහණ - පහන)

   ii. සඳ ..................... පතිතව කුමුදු මල් පිපෙයි. (කිරන - කිරණ)

   iii. ..................... ජීවීන් රැක ගැනීම අපේ යුතුකමකි. (වන - වණ)

   iv. හිරු බැස යත් ම ..................... අඳුර පැතිරෙන්නට විය. (ගණ -ගන)

   v. නැණ ..................... පිරිපුන් දරුවන් හදමු. (නුවණින් - නුවනින්)

   vi. හමන මඳ ..................... ගිමන නිවයි. (නළ - නල)

   vii. ඔහුගේ ගායනය සිත් ඇද ගන්නා ..................... විය. (සුළු - සුලු)

   viii. දේශනයේ දී ඔහු ..................... කළ අදහස් කවුරුත් අගය කළහ. (පල - පළ)

   ix. පිපී වැතෙන ..................... පියුම් වනය වැවෙහි අසිරිය කියා පායි. (හෙල - හෙළ)

   x. සමහරු ..................... යට ගිනි මෙන් සිතෙහි වෛරය රැක ගනිති. (අලු - අළු)

- **ලිඛිත අභ්‍යාස**

2.

- ✓ ප්‍රෞඪ
- ✓ ධවල
- ✓ ඡත්‍ර
- ✓ ශ්‍රේෂ්ඨ
- ✓ අභය
- ✓ සංඝ
- ✓ ධර්ම
- ✓ අඛණ්ඩව
- ✓ ග්‍රන්ථාරූඪ
- ✓ ප්‍රතිඵල
- ✓ සංසිද්ධියකි.



3.

I. සම්ප්‍රදායානුකූලව පොල් තෙල් පහන දල්වා උත්සවය ආරම්භ කෙරිණි. (පහණ - පහන)

II. සඳ කිරණ පතිතව කුමුදු මල් පිපෙයි. (කිරන - කිරණ)

III. වන ජීවීන් රැක ගැනීම අපේ යුතුකමකි. (වන - වණ)

IV. හිරු බැස යත් ම ගන අඳුර පැතිරෙන්නට විය. (ගණ -ගන)

V. නැණ නුවණින් පිරිපුන් දරුවන් හදමු. (නුවණින් - නුවනින්)


VI. හමන මඳ නල ගිමන නිවයි. (නළ - නල)

VII. ඔහුගේ ගායනය සිත් ඇද ගන්නා සුලු විය. (සුළු - සුලු)

VIII. දේශනයේ දී ඔහු පළ කළ අදහස් කවුරුත් අගය කළහ. (පල - පළ)

IX. පිපී වැනෙන හෙළ පියුම් වනය වැවෙහි අසිරිය කියා පායි. (හෙල - හෙළ)

X. සමහරු අළු යට ගිනි මෙන් සිතෙහි වෛරය රැක ගනිති. (අලු - අළු)



4. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා ලියන්න.

i. ශිෂ්ඨාචාරය, ශිෂ්ටාචාරය, ශිස්ටාචාරය
ii. විශ්මය, විෂ්මය, විස්මය
iii. නිෂ්ඵල, නිශ්පල, නිස්ඵල
iv. ආශ්වාද, ආෂ්වාද, ආස්වාද
v. කොට්ඨාශය, කොට්ඨාසය, කොට්ඨාෂය
vi. දුෂ්ට, දුශ්ට, දුස්ට
vii. ප්‍රස්තාර, ප්‍රශ්තාර, ප්‍රෂ්තාර
viii. ආභාෂය, ආභාශය, ආභාසය
ix. නිස්ශබ්ද, නිශ්ශබ්ද, නිෂ්ශබ්ද
x. විශේෂණ, විෂේශණ, විසේසන

5. පහත දැක්වෙන ඡේදවල අක්ෂර වින්‍යාස දෝෂ සහිත ස්ථාන නිවැරදි කර ලියන්න.

i. කඩපොලට ගිය තාත්තා එන තුරු මම කඩුල්ල ලග බලා සිටියෙමි. ඒ ඔහු මට ටොපි දෙකක් රැගෙණ එනු ඇතැයි යන විෂ්වාසයෙනි. අදුර ගලා එද්දී ඈත අහසේ හද පායා එනු පෙනුණි.

i. භාශාවේ විෂේශත්වයක් වන්නේ ලේඛණයට හා කතනයට බාවිත කල හැකි වීම යි. සිංහල බාශාව සැලකූ විට එහි කතන ස්වරූඵයේ ලේඛණ ස්වරූපයට වඩා වෙනස්කම් පවතින බව පෙණේ.

6. පහත සඳහන් වචන ඇතුළත් අර්ථවත් වාක්‍යය බැගින් ලියන්න.

i. ප්‍රදාන ii. නුවණ
iii. නුබ iv. කඳ

**ලිඛිත අභ්‍යාස**

4.

I. ශිෂ්ටාචාරය
II. විස්මය
III. නිෂ්ඵල
IV. ආස්වාද
V. කොට්ඨාසය

VI. දුෂ්ට
VII. ප්‍රස්තාර
VIII. ආභාසය
IX. නිශ්ශබ්ද
X. විශේෂණ

5.

I. කඩපොළට ගිය තාත්තා එන තුරු මම කඩුල්ල ළඟ බලා සිටියෙමි. ඒ ඔහු මට ටොෆී දෙකක් රැගෙන එනු ඇතැයි යන විශ්වාසයෙනි. අඳුර ගලා එද්දී අෑත අහසේ හඳ පායා එනු පෙනුණි.

II. භාෂාවේ විශේෂත්වයක් වන්නේ ලේඛනයට හා කථනයට භාවිත කළ හැකි වීම යි. සිංහල භාෂාව සැලකූ විට එහි කථන ස්වරූපයේ ලේඛන ස්වරූපයට වඩා වෙනස්කම් පවතින බව පෙනේ.

6.

I. විදුහල්පතිතුමා පාසලේ හොඳ ම ශිෂ්‍යයාට ත්‍යාගයක් ප්‍රදානය කළේ ය.
II. පඬිතුමාගේ නුවණ නිසා ප්‍රශ්නය විසඳා ගැනීමට හැකි විය.
III. නුඹ ගැබ පුරා තාරකා පායා තිබේ.
IV. ඔහු කඳ මත හිඳ වෙහෙස ඉවා ගත්තේ ය.

- **ප්‍රායෝගික අභ්‍යාස (Home Work)**

**ප්‍රායෝගික අභ්‍යාස**

1. සිංහල අක්ෂර මාලාව විවිධ අක්ෂර වර්ග සඳහා විවිධ වර්ණ සහිතව ලියා සටහනක් පිළියෙල කරන්න.
2. පුවත්පතක ලිපියක් තෝරා ගෙන එහි අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන තිබේ නම් නිවැරදි කරන්න.

- **ගුණාත්මක යෙදවුම්:**
  - ✓ සිංහල අක්ෂර වින්‍යාස අකාරාදිය
    - ➢ ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
  - ✓ ඇමුණුම 1හි සඳහන් කාර්ය පත්‍රිකාව
    - ➢ ගුරු අත්පොත

## ගුරු ඇස් පොතෙන්...

1. පහත සඳහන් වචනවල හිස්තැනට සුදුසු අකුර රවුමෙන් තෝරා ලියන්න.

I. ආදර් ..... ය - ආදර්ශය
II. ප්‍රදර් ..... නය - ප්‍රදර්ශනය
III. කාර ..... ය - කාරණය
IV. පර .... - පරණ
V. දේශ ...... ය - දේශනය
VI. .... මයා - ළමයා
VII. හා ...... - හාන
VIII. කර ..... - කරන/ කරණ/ කරල
IX. කකු ..... - කකුල
X. පත......... - පතන/ පතල/ පතළ

ණ න
ක
ල ළ
ශ

2. හිස්තැනට සුදුසු අකුර ඉදිරියේ ඇති රවුමෙන් තෝරා ලියන්න.

I. අ ...... ල - අගල
II. කැ ..... - කැඳ
III. ක ...... ය - කඩය/ කඹය
IV. හ ..... - හඳ/ හඬ
V. ක ..... ල - කඳුල/ කඩල
VI. ඇ .... ය - ඇඳය/ ඇඹය
VII. හෙණ් ..... ව - හෙණ්ඩුව
VIII. ඇ ..... ම - ඇඳුම/ ඇඟම
IX. ස .... ල - සඟල
X. ඇ ..... ලය - ඇඹලය

ද ඬ ඟ බ
ඹ ඳු
ඩ
ඳ ඩු ග

3. අසා ලිවීම - 1

I. දර්ශනය
II. ප්‍රදර්ශනය
III. ලේඛනය
IV. වළල්ල
V. කසල
VI. තරුණයා
VII. පරීක්ෂණය
VIII. බළලා
IX. වරල
X. පළලයි.

අසා ලිවීම - 2

I. ලේකම්
II. ඛනිජ
III. ශීඝ්‍රගාමී
IV. විශිෂ්ට
V. ආගාධය
VI. ගාථාව
VII. සභාව
VIII. ප්‍රතිඵල
IX. අපලය
X. බාධාව

4. පහත සඳහන් ඡේදයේ අක්ෂර වින්‍යාසය සදොස් තැන් නිදොස් කරන්න.

මිනිසා කවර කාළයක ලොව පහල වුව ද එසේ පහළ වූ දා සිට සොයාගත් සියළු දේ අතරින් ද නිර්මාණය කරගත් සියලු දේ අතරින් ද සුවිශේෂ ව නිර්මාණය වන්නේ භාශාව යි. මිනිසා භාෂාව සොයා ගත්තේ කිනම් කාලයේ දැයි නිස්චිත ව ම විස්තර කළ නො හැකි වුවත් එය මිනිසාගේ විශිෂ්ඨතම නිර්මාණය යි.

- ✓ කාලයක
- ✓ සියලු
- ✓ භාෂාව
- ✓ නිශ්චිත
- ✓ විශිෂ්ටතම



නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

## නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය - 2020**

**සිංහල භාෂාව**

**7 ශ්‍රේණිය**

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

**(3) ඒකකය**

## <u>අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය</u>

**(1) පහත සඳහන් පාඨයේ යෙදී ඇති මහාප්‍රාණ අක්ෂර සහිත වචන ලියන්න.**

'' ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන මේ ශ්‍රී ලංකාද්වීපයෙහි සතුරු ගනඳුරු බිඳ හැර ධවල ජාත්‍ර නැංවූ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූ වට්ටගාමිණී අභය මහ රජුගේ රාජ්‍ය සමයේ මාතලේ අලු ලෙනේ දී මහා සංඝ රත්නය විසින් ත්‍රිපිටක ධර්ම සංගායනාවක් පවත්වා අඛණ්ඩව සුරක්ෂා කර ගැනීම සඳහා ග්‍රන්ථාරූඪ කර තැනීම ශාසන ඉතිහාසයේ වඩාත් ප්‍රතිඵල දායක වූ සංසිද්ධියකි. ''

…………………………………………………………………………………………..

…………………………………………………………………………………………..

…………………………………………………………………………………………..

**02. පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) අපේ පැරණිම ව්‍යාකරණ ග්‍රන්ථය කුමක් ද ?

…………………………………………………………………………………………..

(ii) එහි එන අක්ෂර මාලාවේ අකුරු ගණන කීයද ?

…………………………………………………………………………………………..

(iii) මහාප්‍රාණ අකුරු හා ශ, ෂ, ෂ අකුරු ඇතුළත් හෝඩිය හඳුන්වන්නේ කවර නමකින් ද?

…………………………………………………………………………………………..

(iv) එම අක්ෂර ගණන කීයද ?

…………………………………………………………………………………………..

(v) ක, ච, ට, ත, ප, ග, ජ, ඩ, ද, බ මෙම අකුරු අල්පප්‍රාණ ලෙස නම් කිරිමට හේතුව කුමක් ද ?

…………………………………………………………………………………………..

(3) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

(i) විශ්මය , විෂ්මය , විස්මය

(ii) නිශ්ශබ්ද , නිස්ශබ්ද , නිෂ්ශබ්ද

(iii) විශේෂණ , විෂේශණ , විසේසන

(iv) ප්‍රස්තාර , ප්‍රශ්තාර , ප්‍රස්තාර


(v) ආශ්වාද , ආෂ්වාද , ආස්වාද

(4) පහත දැක්වෙන ඡේදවල අක්ෂර වින්‍යාස දොෂ සහිත ස්ථාන නිවාරදි කර ලියන්න.

(i) කඩපොලට ගිය තාත්තා එනතුරු මම කඩුල්ල ලඟ බලා සිටියෙමි. ඒ ඔහු මට ටොපී දෙකක් රැගෙණ එනු ඇතැයි යන විෂ්වාසයෙනි. අඳුර ගලා එද්දී ඈත අහසේ හද පායා එනු පෙනුණි.

(ii) භාශාවේ විෂේශත්වයක් වන්නේ ලේඛණයට හා කතනයට බාවිත කල හැකිවීමයි. සිංහල බාෂාව සැලකූ විට එහි කතන ස්වරූපයේ ලේඛණ ස්වරූපයට වඩා වෙනස්කම් පවතින බව පෙණේ.

## අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය



### ලිඛිත අභ්‍යාස

**01. පහත ප්‍රකාශන හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

I පහසුවෙන් උච්චාරණය කළ හැකි අක්ෂර ස්වර අක්ෂර වේ. ( )

II සිදත් සඟරා හෝඩිය රචනා වූයේ අනුරාධපුර සාහිත්‍ය යුගයේ දී ය. ( )

III පාලි සහ සංස්කෘත භාෂාවල ආභාෂය ද සිංහල භාෂාවට බලපා ඇත. ( )

IV අඩු හඬකින් උච්චාරණය කරනු ලබන්නේ මහාප්‍රාණ අක්ෂර වේ. ( )

V නූතන සිංහල හෝඩියට අලුතින් එකතු වූ අක්ෂරයක් වන්නේ 'ෆ' අකුරයි. ( )

**02. හිස්තැනට සුදුසු අක්ෂරය වරහන් තුළින් තෝරා ලියන්න.**

I මර්......නය ( ධ, ද)

II පු......රුත්ථාපනය (න, ණ)

III උද්......ච්ච (ද, ධ)

IV ආමන්ත්‍ර..... (ණ, න)

V ක......කාචාර්ය (ථි, ති)

**03. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

I පුස්ථකාලය , පුස්තකාලය, පුස්තකාළය

II ආශ්චර්යය , ආෂ්චර්යය , ආස්චර්යය

III තීක්ෂන , තීක්ශණ, තීක්ෂණ

IV කිලිපොළනවා, කිළිපොළනවා, කිලිපොලනවා

V නිස්ශබ්ද, නිශ්ශබ්ද , නිෂ්ශබ්ද

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- ජී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

04. පහත සඳහන් එක් එක් පදයේ නිවැරදි අර්ථය තෝරා යා කරන්න.

| (අ) | (ආ) |
|---|---|
| I අබ | සමීප |
| II අගල | භික්ෂුව |
| III අඹ | කුළු බඩු |
| IV අද | ඇස් නොපෙනෙන |
| V සඟ | කාණුව |
| VI අඳ | පලතුරක් |
| VII ළඟ | මිම්මක් |
| | දිනයක් |

05. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.

I සිදත් සඟරා හෝඩියේ ඇතුළත් අක්ෂර ගණන = ............................................

II ව්‍යංජන අක්ෂර හඳුන්වන තවත් නමක් වන්නේ =..............................................

III අනුනාසික්‍ය අක්ෂර හඳුන්වන වෙනත් නමක් ලියන්න =.......................................

IV සිංහල හෝඩියේ ඇතුළත් ස්වර අක්ෂර ගණන =.............................................

V ඌෂ්මාක්ෂරයක් වන්නේ = .......................................................................

සඤ්ඤක අක්ෂර,

18 , සර අක්ෂර,

20 , (අ)ං,

ගාත්‍රාක්ෂර , පනකුරු,

30 , 54 , ෂ

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- ජී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

**මීගමුව අධ්‍යාපන කලාපය**

**සිංහල අංශය-07 ශ්‍රේණිය-03 වන පාඩම**

**අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය - කාර්ය පත්‍රිකාව**

**කාලය : පැය 01යි.**

01) අප සතුව පවතින පැරණිතම ව්‍යාකරණ ග්‍රන්ථය කුමක් ද ?

.................................................................................................... (ලකුණු - 02)

02) එම ග්‍රන්ථයෙහි ඇතුළත් වන අක්ෂර මාලාව හඳුන්වන නම ලියන්න.

.................................................................................................... (ලකුණු - 02)

03) "දෙමාපිය සිනෙහැති - වඳිනුව පා පියුම් පෙති" - මෙම පද්‍ය පාඨය ඇතුළත් වන කෘතියෙහි නම ලියන්න.

.................................................................................................... (ලකුණු - 02)

04) වර්තමාන සිංහල අක්ෂර මාලාවේ මුළු අකුරු ගණන කොපමණ ද ?

.................................................................................................... (ලකුණු - 02)

05) වර්තමාන සිංහල අක්ෂර මාලාවේ ස්වර අකුරු ගණන සහ ව්‍යඤ්ජන අකුරු ගණන කොපමණ දැ යි වෙන වෙන ම ලියන්න.

.................................................................................................... (ලකුණු - 02)

06) සඤ්ඤක අක්ෂර 05 ලියා දක්වන්න.

.................................................................................................... (ලකුණු - 05)

07) මහාප්‍රාණ අක්ෂර 05ක් ලියා දක්වන්න.

.................................................................................................... (ලකුණු - 05)

08) පහත දැක්වෙන වචන නිවැරදි කර ලියන්න.

පරිනාමය - ..................................................

හදාරණ - ..................................................

පැරැණ්නෝ - ..................................................

තෘශ්ණාව - ..................................................

ප්‍රශ්ණ - ..................................................

සණ්ඨාර - ..................................................

කණ්ටජ - ..................................................

ලැබුනේ ය. - ..................................................

කන්ණාඩි - ..................................................

ඔටුණු - .................................................. (ලකුණු - 10)

09) පහත දැක්වෙන වචන නිවැරදි කර ලියන්න.

ලෙන්ගතු - ..................................................

සියළු - ..................................................

පිළිවෙල - ..................................................

පිළියෙළ - ..................................................

දුම්රිය පොල - ..................................................

ඊ ලඟ - ..................................................

පිලිබඳ - ..................................................

ලැව් ගිනි - ..................................................

මහළු - ..................................................

ලහිරු - .................................................. (ලකුණු - 10)

10) පහත දැක්වෙන වචන නිවැරදි කර ලියන්න.

ආස්චර්යය - ..................................................

ශිකර - ..................................................

නිෂ්චල - ..................................................

ශිෂ්ඨාචාරය - ..................................................

විශිෂ්ඨ - ..................................................

ජේෂ්ඨ - ..................................................

කණිෂ්ඨ - ..................................................

නිශ්පාදන - ..................................................

පුස්ථකාල - ..................................................

කොට්ඨාශ - .................................................. (ලකුණු - 10)

**මීගමුව අධ්‍යාපන කලාපය**

**විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය**

**ශ්‍රේණිය : 7**

03 වන පාඩම

# අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය

01. භාෂාවක් සැදී ඇත්තේ කුමකින්ද?

.....................................................................................................................

.....................................................................................................................

02. අක්ෂර යනු කුමක්ද?

.....................................................................................................................

.....................................................................................................................

03. වර්ථමානයේ ලිවිමට සම්මත සිංහල අක්ෂර මාලාවෙ ඇති අකුරු ගණන කොපමණද?

.....................................................................................................................

.....................................................................................................................

04. අක්ෂර මාලාවේ අඩංගු වන්නේ මොනවාද?

.....................................................................................................................

.....................................................................................................................

05. සිදත් සඟරාව භාවිත කළේ කුමක් සඳහාද?

.....................................................................................................................

.....................................................................................................................

06. අප සතුව පවතින් පැරණිම ව්‍යාකරණ ග්‍රන්ථය කුමක්ද?

.....................................................................................................................

.....................................................................................................................

07. සිදත් සඟරා හෝඩියේ අක්ෂර කොපමණද?

.......................................................................................................................

.......................................................................................................................

08. මහාප්‍රාණ අක්ෂර කොපමණද? ඒවා ලියා දක්වන්න.

.......................................................................................................................

.......................................................................................................................

09. අල්පප්‍රාණ අක්ෂර කොපමණද? ඒවා ලියා දක්වන්න.

.......................................................................................................................

.......................................................................................................................

10. සඤ්ඤක අක්ෂර කොපමණද? ඒවා ලියා දක්වන්න.

.......................................................................................................................

.......................................................................................................................

11. සඤ්ඤක අක්ෂරවල විශේෂත්වය කුමක්ද?

.......................................................................................................................

.......................................................................................................................

12. අක්ෂර වින්‍යාසය යනු කුමක්ද?

.......................................................................................................................

.......................................................................................................................

13. අක්ෂර වින්‍යාසය පිළිබඳ දක්වා ඇති පොදු රීති කිහිපයක් දක්වන්න.

.......................................................................................................................

.......................................................................................................................

ගරු ක්‍රිෂාන්ති ප්‍රනාන්දු පැවිදි සොයුරිය

ශා.ජෝෂප් විද්‍යාලය - මීගමුව ශාඛාව

කඩොල් උයන

# පිළිතුරු



**Answer**

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය - 2020

## සිංහල භාෂාව

## 7 ශ්‍රේණිය

**1.**

✓ ප්‍රෞඪ
✓ ධවල
✓ ඡත්‍ර
✓ ශ්‍රේෂ්ඨ
✓ අභය
✓ සංඝ
✓ ධර්ම
✓ අඛණ්ඩව
✓ ග්‍රන්ථාරූඪ
✓ ප්‍රතිඵල
✓ සංසිද්ධියකි.

**2.**

I. සිදත් සඟරාව
II. 30 යි.
III. මිශ්‍ර සිංහල අක්ෂර මාලාව
IV. 60 යි.
V. උච්චාරණය කිරීමේ දී අඩු හඬකින් ශබ්ද වන නිසා.

**3.**

I. විස්මය
II. නිශ්ශබ්ද
III. විශේෂණ
IV. ප්‍රස්තාර
V. ආස්වාද

4.

I. කඩපොළට ගිය තාත්තා එන තුරු මම කඩුල්ල ළඟ බලා සිටියෙමි. ඒ ඔහු මට ටොෆී දෙකක් රැගෙන එනු ඇතැයි යන විශ්වාසයෙනි. අඳුර ගලා එද්දී ඈත අහසේ හඳ පායා එනු පෙනුණි.

II. භාෂාවේ විශේෂත්වයක් වන්නේ ලේඛනයට හා කථනයට භාවිත කළ හැකි වීම යි. සිංහල භාෂාව සැලකූ විට එහි කථන ස්වරූපයේ ලේඛන ස්වරූපයට වඩා වෙනස්කම් පවතින බව පෙනේ.



## අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය

## පිළිතුරු පත්‍රය

**ලිඛිත අභ්‍යාස**

**01** I ( ✓ ) , II ( × ) , III ( ✓ ) , IV ( × ) , V ( ✓ )

**02** I **මර්දනය**

II **පුනරුත්ථාපනය**

III **උද්දච්ච**

IV **ආමන්ත්‍රණ**

V **කටිකාචාර්ය**

**03** I **පුස්තකාලය**

II **ආශ්චර්යය**

III **තීක්ෂණ**

IV **කිලිපොළනවා**

V **නිශ්ශබ්ද**

**04** I **කුළු බඩු**

II **කාණුව**

III **පලතුරක්**

IV **දිනයක්**

V **භික්ෂුව**

VI **ඇස් නො පෙනෙන**

VII **සමීප**

**05** I 30

II **ගාත්‍රාක්ෂර**

III **සඤ්ඤක අක්ෂර**

IV 18

V **ෂ**

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- ජී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

**මීගමුව අධ්‍යාපන කලාපය**

**සිංහල අංශය-07 ශ්‍රේණිය-03 වන පාඩම**

**අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය - කාර්ය පත්‍රිකාව**

**කාලය : පැය 01යි.**

01) අප සතුව පවතින පැරණිතම ව්‍යාකරණ ග්‍රන්ථය කුමක් ද ?

......සිදත් සඟරාව...................................................... (ලකුණු - 02)

02) එම ග්‍රන්ථයෙහි ඇතුළත් වන අක්ෂර මාලාව හඳුන්වන නම ලියන්න.

......සිදත් සඟරා හෝඩිය...................................................... (ලකුණු - 02)

03) "දෙමාපිය සිනෙහැති - වඳිනුව පා පියුම් පෙති" - මෙම පද්‍ය පාඨය ඇතුළත් වන කෘතියෙහි නම ලියන්න.

......කාව්‍යශේඛරය...................................................... (ලකුණු - 02)

04) වර්තමාන සිංහල අක්ෂර මාලාවේ මුළු අකුරු ගණන කොපමණ ද ?

......60යි...................................................... (ලකුණු - 02)

05) වර්තමාන සිංහල අක්ෂර මාලාවේ ස්වර අකුරු ගණන සහ ව්‍යඤ්ජන අකුරු ගණන කොපමණ දැ යි වෙන වෙන ම ලියන්න.

......ස්වර 18යි. ව්‍යඤ්ජන 42යි. (ලකුණු - 02)

06) සඤ්ඤක අක්ෂර 05 ලියා දක්වන්න.

......ඟ, ඦ, ඬ, ඳ, ඹ...................................................... (ලකුණු - 05)

07) මහාප්‍රාණ අක්ෂර 05ක් ලියා දක්වන්න.

......ඛ, ඣ, ධ, ඨ, ඵ...................................................... (ලකුණු - 05)

08) පහත දැක්වෙන වචන නිවැරදි කර ලියන්න.

පරිනාමය - ......පරිණාමය............

හදාරණ - ......හදාරන............

පැරැණ්නෝ - ......පැරැන්නෝ............

තෘශ්ණාව - ......තෘෂ්ණාව............

ප්‍රශ්ණ - ......ප්‍රශ්න............

සණ්ඨාර - ........ඝණ්ටාර........

කණ්ටජ - ........කණ්ඨජ........

ලැබුනේ ය. - ........ලැබුණෝ ය........

කන්ණාඩි - ........කණ්ණාඩි/කන්නාඩි........

ඔටුණු - ........ඔටුනු........ (ලකුණු - 10)

09) පහත දැක්වෙන වචන නිවැරදි කර ලියන්න.

ලෙන්ගතු - ........ළෙන්ගතු........

සියළු - ........සියලු........

පිළිවෙල - ........පිළිවෙළ........

පිළියෙළ - ........පිළිවෙල........

දුම්රිය පොල - ........දුම්රිය පොළ........

ඊ ලඟ - ........ඊළඟ........

පිලිබඳ - ........පිළිබඳ........

ලැව් ගිනි - ........ළැව් ගිනි........

මහළු - ........මහලු........

ලහිරු - ........ළහිරු........ (ලකුණු - 10)

10) පහත දැක්වෙන වචන නිවැරදි කර ලියන්න.

ආස්චර්යය - ........ආශ්චර්යය........

ශිකර - ........ශිඛර........

නිෂ්චල - ........නිශ්චල........

ශිෂ්ඨාචාරය - ........ශිෂ්ටාචාරය........

විශිෂ්ඨ - ........විශිෂ්ට........

ජේෂ්ඨ - ........ජ්‍යෙෂ්ඨ........

කණිෂ්ඨ - ........කනිෂ්ඨ........

නිශ්පාදන - ........නිෂ්පාදන........

පුස්ථකාල - ........පුස්තකාලය........

කොට්ඨාශ - ........කොට්ඨාස........ (ලකුණු - 10)

**මීගමුව අධ්‍යාපන කලාපය**

**විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය**

**ශ්‍රේණිය : 7**

03 වන පාඩම

# අක්ෂර මාලාව හා අක්ෂර වින්‍යාසය

01. භාෂාවක් සෑදී ඇත්තේ කුමකින්ද?

Yíoj ,sù ^tu Yío weig fmfkk mßÈ ,sùu
oelaùug wlaIr - tkï wl=re fhdod .kS

02. අක්ෂර යනු කුමක්ද?

wlaIr hkq i,l=K hs r hkqyË hs i,l=Kl ska
hqayË" wlaIr hkafkys w¾:h hs

03. වර්තමානයේ ලිවීමට සම්මත සිංහල අක්ෂර මාලාවෙ ඇති අකුරු ගණන කොපමණද?

60h

04. අක්ෂර මාලාවේ අඩංගු වන්නේ මොනවාද?

iajr wlaIr 18 laiy jH[ck wlaIr 42 l

05. සිදත් සඟරාව භාවිත කළේ කුමක් සඳහාද?

jHdlrK .%kah laf,i

06. අප සතුව පවතින් පැරණිම ව්‍යාකරණ ග්‍රන්ථය කුමක්ද?

is;aiÕrdj

07. සිදත් සඟරා හෝඩියේ අක්ෂර කොපමණද?

30h

08. මහාප්‍රාණ අක්ෂර කොපමණද? ඒවා ලියා දක්වන්න.

10h

L" P" G" :" M" >" lO" V" O" N

09. අල්පප්‍රාණ අක්ෂර කොපමණද? ඒවා ලියා දක්වන්න.

10h

l" p" g" ;" m" ." c" v" o" n

10. සඤ්ඤක අක්ෂර කොපමණද? ඒවා ලියා දක්වන්න.

5h

Õ" c" ~" |" U

11. සඤ්ඤක අක්ෂරවල විශේෂත්වය කුමක්ද?

i [a[ l wl=e moh l uq fkd fhfok w;r

y,aù fhfoklakao ke;'

12. අක්ෂර වින්‍යාසය යනු කුමක්ද?

f,aLkfhaA isÿ moh lg wh;aw lr

tl$sk lg .<md ,nkq wkqmsì j<

13. අක්ෂර වින්‍යාසය පිළිබඳ දක්වා ඇති පොදු රීති කිහිපයක් දක්වන්න.

y,a"r" hklag miqj uQ¾Oc "K" fhfo!

uQ¾Oc "l" ldrhg miqj uQ¾Oc "K" ldrh fhfo

ගරු ක්‍රිෂාන්ති ප්‍රනාන්දු පැවිදි සොයුරිය

ශා.ජෝෂප් විද්‍යාලය - මීගමුව ශාඛාව

කඩොල් උයන

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ